# ඉසුරුමුනිය හා සාරානන්ද මහ පිරිවෙනෙහි පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථවිද්‍යාත්මක අධ්‍යයනයක්

වැවල ධම්මාලෝක හිමි[1], බෝදාගම සුමන හිමි[2], පාහියංගල සුමංගල හිමි[3]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉපැරණිම ලේඛන මාධ්‍යයක් ලෙස පුස්කොළපොත් හැඳින්විය හැකිය. අපරදිග මැටිපුවරු,පැපිරස්, පාච්මන්ට් හා වෙලම් ලේඛන සඳහා යොදා ගන්නා විට පෙරදිග උණ ලී, ශිලා, රන්, රිදී හා තඹ පත් භාවිතයට ගෙන ඇත.මෙරටෙහිත්‍රිපිටකය, අටුවා, ටීකා, සන්න, හා වෙද පොත් ආදී බොහෝ ඓතිහාසික ග්‍රන්ථවල අත් පිටපත් පුස්කොළ පොත් වීම නිසා පුස්කොළ පොත් සඳහා සුවිශේෂී වටිනාකමක් හිමිව තිබේ. වර්තමානය වන විට මින් බොහෝ ප්‍රමාණයක් ඉංග්‍රීසීන් විසින් ගෙන යන ලදුව බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත් කර ඇති අතර අවශේෂ පුස්කොළපොත් එකතුව දිවයින පුරා පිහිටි ඉපැරණි විහාරස්ථාන කිහිපයක් ආශ්‍රිතව ආරක්ෂා වී ඇත. ඇතැම් විහාරස්ථාන කේන්ද්‍රව යම් පර්යේෂකයින් විසින් ග්‍රන්ථවිද්‍යාත්මක විස්තර ඉදිරිපත් කර ඇති නමුත්සමස්ත පුස්කොළ පොත් පිළිබඳ තවමත් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එකතුවක් සම්පාදනය වී නොමැත. අදවන විට කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්කොළ පොත් ඒකකය මගින් ඒ සඳහා යම් උත්සහයක් දරනු ලබයි.මෙහි දී අනුරපුර දිස්ත්‍රික්කයෙහි පුස්කොළ පොත් ඇති විහාරස්ථාන අතුරින් තෝරාගත් ඉසුරුමුනිය හා සාරානන්ද මහ පිරිවෙනෙහි පුස්කොළ එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත.

## පර්යේෂණ අරමුණු හා වැදගත්කම

මෙම අධ්‍යයනය මගින් ඉසුරුමුනිය හා සාරානන්ද මහ පිරිවෙනෙහි පුස්කොළ පොත් පිළිබඳග්‍රන්ථවිද්‍යාත්මක තොරතුරු එකතුවක් සම්පාදනය කිරීම ප්‍රධාන අරමුණ විය. මීට අමතරව පුස්කොළපොත් ප්‍රමාණාත්මකව හා යම් ප්‍රමාණයකවිෂයාත්මකව හඳුනාගැනීමට ද හැකිවිය. තද්විහාරයන්හි සුරක්ෂිත පුස්කොළ පොත් සඳහා ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කිරීම තුළින් අන්තර්ගත විෂයාත්මක කරුණු හඳුනාගැනීමට හා අන්තර්ගත දැනුම් කාණ්ඩ ගත කිරීමට මෙම

[1] ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

[2] ආධුනික කථිකාචාර්ය,සමාජ විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. bsumana@busl.ac.lk

[3] ආධුනික කථිකාචාර්ය, සමාජ විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

අධ්‍යයනය තුළින් හැකි විය. එමගින් නිසා පර්යේෂකයින්ට අපහසුවකින් තොරව මෙම විහාරයන්හි පුස්කොළ එකතුවට ප්‍රවේශ වී තම පර්යේෂණයන් සිදු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍රය සපයා ගැනීමේ හැකියාව පවතී.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ඉසුරුමුනිය හා සාරානන්ද මහ පිරිවෙන වෙත ගොස් එම ආරාමික පුස්තකාලන්හි තැන්පත් පොත් එකතුව එකිනෙක නිරීක්ෂණය කරමින් අදාළ දත්ත රැස් කර ගන්නා ලදි. එම පුස්කොළ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරයක් පහත ආකෘතියෙන් රැස්කරන ලදි.

### E-01 සද්ධර්ම රත්නාවලී පොත්වහන්සේ

| | | |
|---|---|---|
| භාෂාව | : | සිංහල |
| පත්ඉරු | : | 596 |
| පත්ඉරුවක පේළි | : | 06 |
| අඟලට අකුරු | : | 04 |
| අංකනය | : | කකාරාදී (ක - ඛො,ඔ දක්වා) |
| දිග | : | සෙ.මී. 69 |
| පළල | : | සෙ.මී. 5.5 |
| කම්බය | : | දැව (වර්ණ: රතු, කහ, කොළ, කලු |
| මෝස්තර | : | ලියවැල් හා පලාපෙති, සිංහරුව, බුදුරුව) |
| සකිය | : | නැත |
| හුය | : | හණ නූල |
| කාලය | : | ක්‍රි.ව 1769 |

## විස්තර

සිංහල බසින් ලියා ඇත. පෙළ කියවීම පහසුය. "ශකරාජ වර්ෂ එක්දහස් හත්සිය හැට නවය" යනුවෙන් දිනය සඳහන් වේ. පත්ඉරු ගණන 758ක් බව දක්වා ඇතත් දක්නට ඇත්තේ 596 ක් පමණි. "හිරනූරුවැවේ සිටිනා නැකත් ලේකම බරපැන ගෙවා" පුජා කළ බව සඳහන්වේ. පොත් කම්බයේ ඇතුලු පැත්තේ විසිතුරු කොට අඳින ලද වර්ණවත් බුද්ධරූප ඇත.

මෙහි E-01 යන සංකේතාර්ථයෙන් ඉසුරුමුනි විහාරයට අයත් පළමු ග්‍රන්ථවිද්‍යාත්මක පුස්කොළ පොත ලෙස අර්ථ ගන්වා ඇත.

සාකච්ඡාව

ස්ථානයඃ **ඉසුරුමුණිය**

ඉසුරුමුනිය විහාරස්ථානයෙහි තැන්පත් පුස්කොළ පොත් ගබඩා කාමරයක ලී අල්මාරියක් තුළ එක මත එක තබා රාක්ක පිරී යන සේ අසුරා තිබුණු අතර ඇතැම් පොත් මීයන් විසින් හානි කර ඇති බවට සලකුණු දැක ගත හැකි විය. සියලු පුස්කොල පොත් එළියට ගෙන එකිනෙක පරීක්‍ෂා කරන ලදී. ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව විසින් වරක් පැමිණ පුසකොළ පොත් සංරක්‍ෂණය කර ඇත. එම සංරක්‍ෂණයේ දී පුස්කොළ පොත්වලට කපු නූලෙන් යුත් අලුත් හුය යොදා බැඳ අංක ක්‍රමයක් භාවිතයෙන් අංකනය කර ඇති බව පෙනේ. මෙම අධ්‍යයනයේ දී කොල කැබැල්ලක් අලවා දිග ප්‍රමාණ අනුව පුස්කොල පොත් අංකනය කළ අතර පොත් 28ක් හඳුනා ගත හැකි විය. ඇතැම් පොත් කීපයක පත්‍රවල අංක පිළිවෙළ, පත්‍ර මාරුවීම, දැක ගත හැකි විය.

ඉසුරුමුනි විහාරයේ තිබූ පුස්කොළ පොත් එකතුව ගණනින් 28 කි. මෙම පුස්කොළ පොත් එකතුවෙන් සිංහල භාෂාවෙන් පොත් 10 ක් ද, පාලි භාෂාවෙන් පොත් 11 ක් ද, පාලි හා සිංහල භාෂා ද්වයෙන් පොත් 6 ක්, සියම් භාෂාවෙන් පොත් 01 ක් ද රචනා කරඇති බව අනාවරණය කර ගන්නා ලදී.එසේම සියලු පුස්කොළ පොත් මහනුවර යුගයට හා ඉන් පසු කාලවකවානුවට අයත් බව ඇතැම් පොත්හි රචනා කරන ලද වර්ෂ දක්වා තිබීමෙන් පැහැදිලි වේ.ඇතැම් පුස්කොළ පොත්වල කර්තෘ නාම දක්වා තිබුණ ද, බොහෝ ප්‍රමාණයක කර්තෘ හඳුනාගැනීමට නොහැක. පොත් අංකනය සඳහා සිංහල අක්‍ෂර හා අරාබි ඉලක්කම් භාවිත කර ඇත. මෙම පුස්කොළ පොත්වල පළල (සෙ.මී 5, සෙ.මී 5.5, සෙ.මී 6)යන ප්‍රමාණයන්ගෙන් යුක්ත වන අතර දිග සෙ.මී 40 සිට සෙ.මී 70 දක්වා එකිනෙකට වෙනස් ප්‍රමාණයන් ගෙන් දැක ගත හැකි විය. පුස්කොළ පොත්වල කම්බය සඳහා ලියවැල්, පලා පෙති සහිත වර්ණ දැව ද,සකිය සඳහා ලෝහ, කාසි, වීදුරු බෝල හා ප්ලාස්ටික් බොත්තම් ද, හුය සඳහා කපු හා හණ ද භාවිත කර තිබේ. මෙම අධ්‍යයනයට අනුව සමස්ථ පුස්කොළ පොත් එකතුවෙන් 24 ක් ධර්ම ග්‍රන්ථ ද, පොත් 03 ක් වෙද පොත් ද, අන්තර්ගතය හඳුනා නොගත් එක පොතක් ද විෂයාත්මකව දැක්විය හැකිය.

ස්ථානයඃ **සාරානන්ද මහ පිරිවෙන** (ඉසුරුමුනිය විහාරස්ථානයෙහි පුස්කොළ පොත් එකතුව පිළිබඳ දක්වා ඇති මූලික ලක්‍ෂණ සාරානන්ද පිරිවෙන් පුස්කොළ පොත් එකතුවෙහි ද දැක ගත හැකි විය.)

සාරානන්ද මහ පිරිවෙනෙහි මුළු පුස්කොළ එකතුවෙන් ධර්ම ග්‍රන්ථ 08 ක් ද, මන්ත්‍ර පොත් 02 ක් ද, සිංහල වෙද පොත් 11 ක් ද, අන්තර්ගතය හඳුනා නොගත් පොත් 02 ක් සහිතව පුස්කොළ පොත් 23 ක් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී.එම පොත් එකතුවෙන් සිංහල භාෂාවෙන් රචිත පොත් 16 ක් ද, පාලි හා සිංහල භාෂාද්වයෙන් රචිත පොත් 8 ක් ද රචනා කර ඇත. එහි

18 වන සියවසට අයත් පොත් 2 ක් ද, 19 වන සියවසට අයත් පොත් 03 ක් ද තිබූ අතර අනෙක් පොත්වල කාලය සඳහන්ව නොමැත. පුස්කොළ පොත් කිහිපයක පමණක් කර්තෘ නාමය දක්වා ඇති නමුත් බොහෝමයක කර්තෘ අඥාතය. මෙම පොත් එකතුවෙහි ද අංකනය සඳහා සිංහල අක්ෂර හා අරාබි ඉලක්කම් භාවිත කර ඇති අතර අංකනය හඳුනා ගැනීමට නොහැකි හා අංකනය කර නොමැති පොත් කිහිපයක් ද හමුවිය. මෙම පුස්කොළ පොත්වල පළල (සෙ.මි 5, සෙ.මී 5.5, සෙ.මි 6) යන ප්‍රමාණයන්ගෙන් යුක්ත වන අතර දිග සෙ.මී 10.5 සිට සෙ.මී 51.5 දක්වා එකිනෙකට වෙනස් ප්‍රමාණයන් ගෙන් දක ගත හැකි විය. පුස්කොළ පොත්වල කම්බය සඳහා ලියවැල්, පලා පෙති සහිත වර්ණ දව හා පුස්කොළද,සකිය සඳහා ලෝහ, කාසි, වීදුරු බෝල, වීදුරු පබලු, ප්ලාස්ටික් බොත්තම්, පිඟන් මැටි හා දළකඩ ද, හුය සඳහා කපු ද භාවිත කර ඇත.

## නිගමනය

මෙම අධ්‍යයන මගින් ලබා ගත් තොරතුරු මත පදනම්ව ඉසුරුමුණිය හා සාරානන්ද පිරිවෙන සතුව ඇති පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථවිද්‍යාත්මක විස්තරයක් ඉහතින් ඉදිරිපත් කර ඇති අතර පර්යේෂකයන්ට එමගින් තම අවශ්‍යතාවය උදෙසා පුස්කොළ පොත් වෙත ප්‍රවේශ වීමට හැකියාව ලැබී ඇත. තව ද අසංවිධානාත්මකව රාක්ක තුළ ගොඩ ගසා තිබීම නිසා ඒ වන විට අනතුරුදායක තත්වයක් ඇති වී තිබිණි. එසේම මෙම පර්යේෂණයේ දී සකිය, කම්බය හා හුය නැති පුස්කොළ පොත් ද හමුවීම නිසා සමස්ත පුස්කොළ පොත් සංරක්ෂණය කිරීමට හා නවීන ක්‍රම භාවිතයෙන් විද්‍යුත් මූලාශ්‍රය බවට පත් කිරීම යුගයේ අවශ්‍යතාවක් ලෙස පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පදඃ පුස්කොළ පොත්, ඉසුරුමුනිය, සාරානන්ද මහ පිරිවෙන, ඉපැරණි ලේඛන මාධ්‍යය, අත්පිටපත්

## ආශ්‍රිත ග්‍රන්ථ

අදිකාරි, අබයරත්න. (2000). *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන,* නුගේගොඩ, තිමිර.

පියරතන හිමි, ලැඟුම්දෙණියේ. (2014). "ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාල ඉතිහාසය" *ජ්‍යේෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය,* පියදාස රාගමඃ රණසිංහ පදනම.

ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ. (1992). "ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය" සංස්. කුඹුරුගමුවේ වජිර හිමි, ඩබ්ලිව්. ජී. වීරරත්න සහ සනත් නානායක්කාර, කොළඹඃ බුද්ධශාසන අමාත්‍යාංශය.